# දරුවන්ගේ සුළු සුළු වැරදි දරු සෙනෙහස නිසා නොසලකා හරිමුද ?



**දෙමව්පියන්ගේ ජීවිතවල තම දරුවන් සඳහා වෙන් වී ඇති අවකාශය දරුවන් එම වයස් සීමාව තුලදී නම් කිසිම විටෙක අවබෝධ කර නොග න්නා තරමටම පරිමාවෙන් විශාල එකකි. එම දරු සෙනෙහසේ දිග පළල ඔවුන් නියමාකාරයෙන් අවබෝධ කරගත්තේ මතුයම් දිනකදී කාලයාගේ ඇවෑමෙන් ඔවුන් ද උතුම් මව් පිය පදවියට පත්වූ කල්හිය.**

දෙමව්පියන්ගේ ජීවිතවල තම දරුවන් සඳහා වෙන් වී ඇති අවකාශය දරුවන් එම වයස් සීමාව තුලදී නම් කිසිම විටෙක අවබෝධ කර නොගන්නා තරමටම පරිමාවෙන් විශාල එකකි. එම දරු සෙනෙහසේ දිග පළල ඔවුන් නියමාකාරයෙන් අවබෝධ කරගත්තේ මතුයම් දිනකදී කාලයාගේ ඇවෑමෙන් ඔවුන් ද උතුම් මව් පිය පදවියට පත්වූ කල්හිය.

දෙමව්පියන් තුල වන උතුරා ගලන දරු සෙනෙහස නිසා ඔවුන් තම ලෙයින් උපන් දරුවන් කුඩා කල හැඬවීමට, ඔවුන්ගේ කඳුළු දැකීමට දක්වන්නේ බලවත් අකමැත්තකි. මෙලොව එළිය දුටු බිළිඳා තම මව සමඟ සන්නිවේදනය සඳහා මුලින්ම කරන්නේ හැඬීමයි. එමඟින් ඔවුන් තම සියළුම ඕනෑ එපාකම් ඉටකරගනු ලබයි. කුස හිස්වූ පසුව, නැපිය තෙත් වූ පසුව, ආදරය, ආරක්ෂාව, උණුසුම, රැකවරනය වැනි බිළිඳාගේ නොයෙකුත් අව්‍යශතා සඳහා ඔවුන් හඬයි. එම ඇඬුම් හඬට දිව එන මව හෝ වෙනත් වැඩිහිටියෙකු මාර්ගයෙන් එම බිළිඳාගේ අවශ්‍යතා නොපිරිහෙලා ඉටුවෙයි.

බොහෝවිට වයස අවුරුදු හය - හත දක්වා තරම් කුඩා දරුවන් මෙම ක්‍රමය දිගටම අනුගමනය කිරීමට උත්සාහ ගනු ලබන්නේ දෙමව්පියන් බිය වැද්දීමේ පහසුම අවිය කඳුල බව ඔවුන් වටහාගන්නා නිසාය. ඉතාම සරලව පැවසුව හොත් ඔවුන් 'හඬා ජය ගැනීමට' උත්සහ කරයි. මෙලෙස හඬා දොඩා දරුවන් ඉල්ලන බොහෝ දේවල් ඔවුනට අවශ්‍ය දේවල් නොවන නමුත් තමා පන මෙන් ආදරය කරන දරු පැටියා හැඬවීමට ඇති අකමැත්ත නිසා අතේ ඇති මුදල වියදම් කර දරුවා සැනසීමට දෙමව්පියන් පෙළඹේ.

ළමාවියේ කුතුහලය නිසා ඔවුන් බොහෝ විට මෙසේ ඉල්ලා සිටින්නේ රූපවාහිනියේ වෙළඳ දැන්වීම් මගින් නිතරම දැකිය හැකි හෝ සම වයසේ යහළුවන් ළඟ ඇති සෙල්ලම් බඩුය. මෙයින් සමහර දේ ළමුන් ඉතා පහසුවෙන් ඇබ්බැහි වන ආකාරයේ ක්‍රීඩාවන්ය. උදාහරනයක් ලෙස පරිගනක ක්‍රීඩා, නින්ටෙන්ඩෝ ක්‍රීඩා වැනි දේ හෝ සෙල්ලම් තුවක්කුව වැනි ළමා මනසට තරම් නොවන ක්‍රීඩා භාණ්ඩයක් විය හැක.

අපි කුඩා අවධියේ මෙන් කුරුම්බැට්ටි මැසිමකින් මසා කොස් කොල ඔටුන්නක් සාදා එසේත් නැතිනම් පොල්පිති ගොනෙකු සාදා ඒවාත් සමඟ දවසම සෙල්ලම් කිරීමට හෝ සරුංගලයක් උඩ යැවීමට වෙල් ඉපනැල්ලක දුව පැනීමට අපේ ලමුන්ට අවකාශයන් නැති නමුත් දරුවන් අඬා දොඩා ඉල්ලන නිසාම ඔවුන්ගේ කඳුල ජය ගැනීමට ඉඩ හැර ඔවුන් ඉල්ලන සියළුම දේ පාලනයකින් තොරවම ඔවුන්ට ලබා දෙනවාද යන්න දෙවරක් සිතා බැලිය යුතුය.

එයට හේතුව මෙම කුඩා දරුවන් හෙට දිනය ලොව බාරගන්නා වැඩිහිටියන් බවට පත්වන නිසාය. ඔවුන් වයසින් වැඩි තරුණ වියට එළැඹී පසුවද තමන්ට අවශ්‍ය දේ පමනක් තෝරා බේරා ගැනීමට හැකියාවක් නොමැති කමින් එසේත් නැතිනම් අරපිරිමැස්ම නොදන්නා හෙයින් දෙමව්පියන්ගේ මුදල් නාස්තිකාර ලෙස වියදම් කරන ආකාරයට අප සමාජය තුලින් ඕනෑ තරම් උදාහරන පෙන්වා දිය හැකිය.

මා හොඳින් දන්නා පවුල් කීපයකම යොවුන් වියට එළැඹී දියණිවරුන් පිළිබඳව ඔවුන්ගේ අම්මලාගෙන් නැගෙන සුලබ මැසිවිල්ලක් වන්නේ එම යෞවනියන් තම ඇඳුම් තේරීමේදී කල් පැවැත්ම, මැහුමේ හොඳ නරක, ගෙවන මුදලට වටිනවාද යන්න. හා රෙදි වර්ගය වැනි අත්‍යාවශ්‍ය ලෙස සොයා බැලිය යුතු දේ නොසලකා හරිමින් වෙළඳ නාමය සහ විලාසිතාව පමණක්ම සලකා එම තේරීම කරනු ලබන බවයි. මෙකී වෙළඳ නාමය එම වයස් කාණ්ඩ අතර ප්‍රචලිත ඉහලම තත්වයේ එකක් වන නිසා ඒ සඳහා ගෙවීමට සිදුවන බර පැනද ඒ තරමටම විශාලය. දැරිය නොහැකි ලෙස ඉහල යන ජීවන වියදම මතට කඩා වැටෙන මෙවන් ආටෝප වියදම් නිසා දෙමව්පියන් වැටෙන්නේ කබලෙන් ලිපටය. නමුත් කුඩා අවධියේදී 'නැහැ' 'බැහැ' නොකියා කුමාර ලීලාවෙන් සැප දී හැදූ දරුවනට මුදලේ අගය වටහා දීම පහසුවෙන් කළ හැක්කක් නොවේ. එයට හේතුව ඒ පිළිබඳව මූලික අවබෝධය කුඩා කාලයේදි ඔවුනට අවබෝධ කරවීම අප විසින් අතපසු කර තිබීමය.

තම දරුවන්ට ඇති අසීමිත ආදරය නිසාම දෙමව්පියන් තම දරුවන්ගේ වැරදි දකින්නට ඉතාම අකමැතිය. එම හේතුව නිසාම දෙමව්පියන් බොහෝවිට දරුවන්ගේ සුළු සුළු වැරදි නොසලකා හැර ළමුන් කාණ්ඩයක් එකතු වී කරන ලද වැරදි වැඩකට අපේ ළමුන්ද සහභාගි වී ඇත්නම් එසේ වූයේ අනික් ළමුන්ගේ බලපෑම නිසා බව සිතා හෝ හිත රවටා ගැනීමට උත්සහ දරන්නේ මෙනිසාය.

දෙමව්පියන්ගේ මෙම දුර්වලතාවය හඳුනාගන්නා දරුවන් එයින් ප්‍රයෝජන ගන්නේ ඉතාමත් සූක්ෂම අයුරිනි.

කරන ලද වැරැද්ද අනිකෙකුගේ ගිනුමට බැර කර දෙමව්පියන් රවටා නිදහස් වීමට දරුවන් පෙළඹෙන්නේ මෙවන් අවස්ථ ාවලදී. මෙය දරුවා තම ජීවිතයේ ගොතන මුල්ම බොරුව වීමට බැරි නැත. මෙතැනදී දෙමව්පියන් ලෙස අපේ වගකීම වන්නේ, දරුවා ගොතන ලද මුල්ම බොරුව ඔහුගේ හෝ ඇයගේ අවසානම බොරුව බවට පත් කර ගැනීමට උත්සහ දැරීමයි. මේ සඳහා අපට ගත හැකි පහසුම ක්‍රියා මාර්ගය වන්නේ දරුවන්ගේ මුවින් එලියට පැන අපේ සවනට රිංගන සියළුම දේ සත්‍ය ලෙස පිළිනොගෙන ඔවුන් පිළිබඳව දැඩි සෙවිල්ලකින් සිටීමයි.

ගැටවර වියේ දරුවන් කෙරෙහි නම් අපි වඩාත් සැලකිලිමත් විය යුතුය. දරුවන් ලඟින්ම අශ්‍රය කරන යහළුවන් සහ ඔවුන්ගේ පවුල්වල පසුබිම පිළිබඳව, දරුවන්ගේ ගමන් බිමන් සම්බන්ධව, ඔවුන්ගේ අමතර පංති පැවැත්වෙන වේලාවන් පිළිබඳව අපි නිතරෝම සොයා බැලුවහොත් නරක ආශ්‍රය නිසා දරුවන් නොමඟ යාමට ඇති ඉඩකඩ අවම කරගත හැකිය. මත්පැන්, සිගරැට්, මත්ද්‍රව්‍ය වැනි නොයෙකුත් දුරාචාරයන්ට පහසුවෙන් ළමුන් ගොදුරු වන්නේ මෙම ගැටවර වියේදී බව අප කවුරුත් දන්නා සත්‍යයකි.

මීට අමතරව දරුවන් දවසේ වැඩි වේලාවක් අන්තර්ජාලයේම සැරිසරනවා නම්, ඔවුන් සොයන්නේ අධ්‍යාපනයට අදාල දැනුමද එසේත් නැතහොත් වෙන අන් යමක්ද යන්න දෙමව්පියන් ලෙස අප සොයා බැලීම වටී. ඒ මන්ද යත් කම්පියුටර් මාධ්‍යය දරුවන්ට හොඳ මෙන්ම නරකද එකසේ උකහාගත හැකි මාධ්‍යයක් වන බැවිනි.

යෞවනියන් සම්බන්ධව සලකන විට ඔවුන්ගේ එදිනෙදා සාමාන්‍ය ඉරියව්වල කිසියම් හෝ වෙනසක් දක්නට ලැබේනම්, දෙමව්පියන් ලෙස අපි ඉතාමත් සැලකිලිමත් වීම වටී. මා ඉහතින් සඳහන් කල යම් දුරාචාරයනට ඇබ්බැහි වීම හෝ ඔවුන්ගේ නොගැලපෙන පෙම් පලහිලව්වක් නිසා අධ්‍යාපන දිවියම අඳුරු කර ගැනීමට ඉඩ ඇති මෙම කාලයේදී ඔවුන් පිළිබඳව මනා සෙවිල්ලෙන් සිට ඔවුනගේ වැරදිවලට නිසි අවවාද කර යහමග ට ගැනීම දෙමව්පියන්ගේ වගකිම වේ. එසේ නොවුනහොත් ඔවුනට අනාගතය දැක හෙට දිනයේදී අපට කඳුළු සැලීමට සිදුවනු ඇත.

මෙම ලිපිය අවසාන කිරීමට මත්තෙන් මීට වසර ගනනාවකට පෙර මා පුවත්පතක කියවූ මා මතකයෙන් කිසිම දිනක ගිලි නොයන මෙම සත්‍ය කථාවද මෙහි සඳහන් කිරීම සුදුසු යයි සිතේ.

මෙය ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙලේ මංකොල්ල ගනනාවකටම සම්බන්ධ වූ මංකොල්ල කරුවකු අල්ලා නීතිය මාර්ගයට ඉදිරිපත් කල පසු ඔහු පැවසුවායයි කියවෙන කථාවකි. එනම් "මාව මේ තත්වයට පත්කලේ මගේ අම්මා" යයි ඔහු පවසා තිබේ. එයට හේතුව ලෙස ඔහු දක්වා තිබෙන්නේ, ඔහුගේ පලමු හොරකම ලෙස ගමේ වෙලඳසැලෙන් උම්බලකඩ කැබැල්ලක් සොරකම් කොට ගෙන ගොස් මවට දුන් පසු ඇය ඒ සඳහා ඔහුට දඬුවමක් නොකිරීමය. උම්ලකඩ කැබැල්ලෙන් සොරකම පටන් ගත් ඔහු සිරගෙට ගියේ අංක එකේ මංකොල්ලකරුවකු ලෙසින්. "මගේ මුල්ම හොරකම දවසේ අම්මා මට තරවටු කොට දඬුවම් කලා නම් මට මෙවන් ඉරනමක් අත්නොවන්නට ඉඩ තිබුණා."යයි ඔහු එහිදි ප්‍රකාශ කොට තිබුනි.

ඉහත කතාවෙන් අපට හොඳ ආදර්ශයක් ලැබෙන බව මගේ හැඟීමයි. දරුවන් නොතේරුම් වයසේදී කරන වැරැද්දකට දඬුවම් කිරීමට දෙමව්පියන් ලෙස අප මැලිවිය යුතු නැත. අප කුඩා අවදියේදී අපේ දෙමව්පියන් අපේ වැරදි වලට දඬුවම් කලේ, ඔවුන් තුල අප කෙරෙහි වූ උතරා ගිය දරු සෙනෙහස නිසා මිස අප කෙරෙහි වූ අනාදරයට නොවන බව අප අද දිනයේදී වටහාගෙන ඇතුවක් මෙන්ම, හෙට දිනයේදී වැඩිහිටියන් වන අපේ දරුවන් ද අද දිනයේදී ඔවුන් කරන වැරදි පෙන්වා අප කරන තරවටුවට දඬුවමට අනාගතයේදී දහස් වර අපට පින් දෙනු ඇත.

සුභාෂිනී හේරත්

ඇට්වුඩ්

## දාරක ස්නේහය

## හෙවත්

## සසර බැම්ම

මැදි වියෙත් හරි මැදයි දිවි ගෙවන්නේ මෙමා
සසර බැම් බිඳ හෙලන මඟ සොයන කළ සොඳා
අපිස් දිවියට මගේ ඇල්ම නැතුවා නොවේ
දිගු සසර ගමනටත් බියක් නැතුවා නොවේ

මේ සියළු සිතුවිලි සුනු විසුනු කර දමා
දරු සෙනේ බැම් බිඳේ පවුරු පදනම් දමා

අම්මගේ කෑම නම් හරිම රසයයි කියන
අනල කැව්වොතින් අපි තවත් කනවැයි කියන
මට මගේ දරු දෙපල සසර මග දිගු කරන
රැහැන් පටවල් නොවෙද සිඳලන්න සිත නොදෙන


සාමන්ත තැන්නගේ

සුභාෂිනී හේරත්

ඇට්වුඩ්